2024.12.21 ලංකාදීප. පිටුව 5

# යාචක සංගණනයකුත් එයි

■ නිමල කොඩිතුවක්කු

**මෙරට යාචකයන් හා නිවෙස් නොමැතිව වීදිවල ජීවත් වන පුද්ගලයන් පිළිබඳවද සංගණනයක් කළ බව ජන ලේඛන සහ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව පවසයි.**

ජන හා නිවාස සංගණනයේ කටයුතුවලට සමගාමීව මෙම දත්ත රැස්කළ බව එහි අධ්‍යක්ෂ ජනරාල් අනෝජා සෙනෙවිරත්න මහත්මිය පැවසුවාය.

ජන හා නිවාස සංගණනයේ තොරතුරු රැස්කිරීම 2024 වසරේ ඔක්තෝබර් මාසයේ ආරම්භ කළ අතර ඒ සඳහා නිලධාරීන් 35,000 ක් පමණ රටපුරා යොදවා ඇතැයිද අධ්‍යක්ෂ ජනරාල්වරිය කීවාය. මෙම සංගණනයෙන් ඉදිරි වසර 10 සඳහා ජාතික ප්‍රතිපත්ති සම්පාදනයට සැලසුම් සකස් කිරීමට අවශ්‍ය තොරතුරු දීමට නියමිතය.

එම සංගණන කටයුතු මෙම දෙසැම්බර් මස 23 වැනි දිනෙන් අවසන් කිරීමට බලාපොරොත්තු වන බවද අධ්‍යක්ෂ ජනරාල්වරිය පැවසුවාය.

සංගණන ආඥාපනත යටතේ පැවරී ඇති බලතල අනුව මෙම තොරතුරු රැස්කරන බැවින් කිසිදු ආකාරයකින් පෞද්ගලික මට්ටමේ තීන්දු ගැනීමට මෙම තොරතුරු භාවිත නොවන බවත් ඇය සඳහන් කළාය.